*සැ. යු.* - 2024.11.14 දින පළ කරන ලද අංක 2411 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවී ය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,412 - 2024 නොවැම්බර් මස 22 වැනි සිකුරාදා - 2024.11.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 1920 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1929 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 නොවැම්බර් මස 29 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 නොවැම්බර් මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත

### බස්නාහිර පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා අධ්‍යාපනවේදී උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2024

බස්නාහිර පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ පුරප්පාඩු සඳහා බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි අධ්‍යාපනවේදී උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය විෂයයන් සඳහා ගුරු පුරප්පාඩු සඳහා මෙම බඳවා ගැනීම සිදු කරන අතර පවතින ප්‍රතිපාදන හා පුරප්පාඩු සංඛ්‍යාව මත බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කරනු ලැබේ. මෙහි දී සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර එහි දී ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන්ගේ මුළු කුසලතාවයේ අනුපිළිවෙල මත බඳවාගැනීම් කටයුතු සිදු කෙරේ.

2. වැටුප් ක්‍රමය :-

මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය 2022.01.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 (IV) හි ජී-ඊ-2-2016 - ඒ දරන වැටුප් බණ්ඩයට අදාළ,

**රු. 39,175 - 10x825 - 7x1,335 - 20x1,630 - රු. 89,370 - වේ.**

ඔබ මෙම වැටුප් පරිමාණයේ 03 වන පියවර වන රු. 40,825/- වැටුප් තලයේ පිහිටවනු ලැබේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාවන් ද ඔබට හිමිය.

3. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

3.1. අධ්‍යාපන සුදුසුකම්.-

(i) ඉගැන්වීමේ කාර්යයක් සඳහා පිළිගත් සුවිශේෂී කරන ලද ක්ෂේත්‍රවලට අයත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මගින් ප්‍රදානය කරනු ලැබූ අධ්‍යාපනවේදී උපාධියක් විය යුතුය. මෙම උපාධිය සුදුසුකම් සලකා බලන දිනට (2024.07.31) පෙර වලංගු උපාධියක් විය යුතුය ;

*සහ*

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දෙවරකට නොවැඩි වාර ගණනක දී මව්බස සහ ගණිතය සඳහා සාමාර්ථයන් සහිතව සම්මාන තුනක් සමඟ විෂයයන් හයක් (06) සමත් වීම. (එක් වතාවක දී අවම වශයෙන් විෂයයන් පහක් (05) සමත් ව තිබිය යුතුය.) *සහ*

(iii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී එකවර විෂයයන් තුනක් (03) සහිත ව සමත් ව තිබිය යුතු ය.

***ඉතා වැදගත්*** : (අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීමේ දී සැලකිල්ලට ගත යුතු ය.)

* ස්වකීය උපාධිය අනුව ඉල්ලුම් කළ හැකි විෂයය හා මාධ්‍යය පිළිබඳව අයදුම්කරුවන් සැළකිලිමත් විය යුතු ය. (උපලේඛන 01 හා 02)
* එහිදී ප්‍රවීණතාවය ලද විෂයය අනුව පමණක් අදාළ ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ යුතු ය.
* ඉල්ලුම් කළ හැක්කේ එක් විෂයයක් පමණි.
* ඉල්ලුම් කළ විෂයය හා මාධ්‍ය කිසිදු හේතුවක් මත පසුව වෙනස් කිරීමට ඉඩ ලබා දෙනු නොලැබේ.
* ඔබ ඉල්ලුම් කරන විෂයය ඔබ හදාරා ඇති අධ්‍යාපනවේදී උපාධිය තුළ හදාරා ඇති බවට විශ්වවිද්‍යාලය මගින්

තහවුරු කෙරෙන ලිපියක් හා එම විෂයට අදාළව ඔබ ගුරු පුහුණුව හදාරා ඇති බවට සනාථ කෙරෙන ලිපියක් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

3.2. කායික හා මානසික යෝග්‍යතාවය :

සෑම අයදුම්කරුවෙකු ම ගුරුවරයෙකු වශයෙන් රාජකාරි ඉටු කිරීමට සරිලන මානසික සහ ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

3.3. වයස :

සුදුසුකම් සලකා බලන දිනට (2024.07.31) වයස අවුරුදු 18ට නොඅඩු හා 35ට නොවැඩි විය යුතුය.

3.4. වෙනත් සුදුසුකම් :

(i) අයදුම්කරු/කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ii) අයදුම්කරු/කාරිය විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) පුරප්පාඩු සඳහා ඉල්ලුම් කරන අයදුම්කරු/කාරි හෝ කලත්‍රයා, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03කට නොඅඩු කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුය. (ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය (ඩී.එස්.04) මගින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී පදිංචිය සනාථ කළ යුතුය.

(iv) බස්නාහිර පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි විය යුතුය.

3.5. සුදුසුකම් සලකා බැලීමේ අවසන් දිනය : **2024.07.31**

ඉහත සඳහන් කරනු ලබන සියලුම සුදුසුකම් **2024.07.31** දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.

4. සේවා කොන්දේසි :

(i) රාජ්‍ය/පළාත් සභා රාජ්‍ය සේවා පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලට ද යටත්ව තෝරා ගනු ලබන උපාධිධාරී අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ii) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට පත්වීම්ලාභීන් යටත් විය යුතුය.

(iii) මෙම තනතුරට පත් කරනු ලබන්නන් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

(iv) බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අනුව උසස්වීම් සිදු කරනු ලැබේ.

(v) 2020.10.16 දිනැති රා.ප.ච.18/2020 හා එයට වරින් වර සිදු කරන සංශෝධනයන්ට අනුව නියම කර ඇති පරිදි දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

5. බඳවාගැනීම :

5.1. බඳවා ගැනීමේ ක්‍රමය :

2008.07.01 දින සිට ක්‍රියාත්මක බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.3.5 වගන්තිය අනුව බඳවාගැනීම සිදු කරනු ලැබේ.

තෝරාගැනීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත් වේ.

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයට යොමු කරනු ලැබේ. (ගුරු සේවා ව්‍යවස්ථාවේ 7.2.4.3. (අ) වගන්තිය බලපැවැත්වේ.)

ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබාගත් මුළු ලකුණු වල කුසලතාවය පදනම්ව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩු සඳහා තෝරා ගනු ලැබේ.

5.2. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික සුදුසුකම් පරීක්ෂා කිරීම.

5.3. ප්‍රායෝගික පරීක්ෂණය :

ප්‍රායෝගික පරීක්ෂණයේ දී අයදුම්කරු විසින් හඳුනා ගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. මේ සඳහා පහත පරිදි ලකුණු හිමි වේ.

| *අනු. අංකය* | *ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙනු ලබන නිර්ණායක* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිශ්ට වීම | 05 | 02 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 03 | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| 04 | කාල කළමනාකරණය | 05 | 02 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය | 25 | 10 |

5.4. ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය :

(i) ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කාලය විනාඩි පහකට (05) නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ.

(ii) ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසි පහකි. (25).

(iii) ප්‍රායෝගික පරීක්ෂණය සමත් වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු දෙක (02) බැගින් ලබා ගත යුතුය.

(iv) ප්‍රායෝගික පරීක්ෂණයේ ඇගයීම බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

5.5. නිර්ණායකයන් හි අරමුණු :

ගුරු වෘත්තියේ දී වැදගත්වන ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාව මැන බැලීම.

(i) අරමුණ හා ප්‍රවිශ්ට වීම :

සාර්ථකව පාඩමෙහි අරමුණු පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිශ්ට වීමේ හැකියාව ඇගයීම.

(ii) පෞරුෂය හා හඬ පාලනය :

ගුරුවරයෙකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ දී මනා ලෙස හඬ පාලනය කිරීමට ඇති හැකියාව ඇගයීම.

(iii) සන්නිවේදනයේ පැහැදිලි බව :

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අදාළ කරුණු ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම .

(iv) කාල කළමනාකරණය :

ලබා දෙනු ලබන කාල සීමාව තුළ අරමුණ කෙරෙහි ළඟා වීමේ කුසලතාවය ඇගයීම.

(v) ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය :

අරමුණ කෙරෙහි ලඟා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිතා කිරීමේ හැකියාව ඇගයීම

6. අයදුම් කළ යුතු පිළිවෙල :

(i) සියලුම අයදුම්කරුවන් www.psc.wp.gov.lk යන අපගේ නිල වෙබ් අඩවියට පිවිස මෙම විභාග නිවේදනය අනුව නිල වෙබ් අඩවියට උඩුගත (Upload) කර ඇති අයදුම්පත බාගත කිරීම සිදුකළ හැකිය.

(ii) අදාළ තොරතුරු ඇතුළත් කරමින්, අයදුම්පත සම්පූර්ණ කළ යුතුය. අයදුම්පත පිරවීමේ දී යොමු කර ඇති උපලේඛන 01 හා 02 උපයෝගී කර ගත යුතුය.

(iii) අසම්පූර්ණ ලෙස තොරතුරු යොමු කර ඇති අයදුම්පත්, මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කර එවනු ලබන අයදුම්පතෙ හි ජායා පිටපතක් අයදුම්කරු සතුව තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

(iv) අයදුම් කරනු ලබන විෂයය පසුව වෙනස් කිරීමට කිසිසේත් ඉඩ නොලබන අතර එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

අයදුම්පත සමඟ කිසිඳු සහතිකයක් අමුණා නොඑවිය යුතුය.

(v) අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු අතර අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් යොමු කළ යුතුය. එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයකු, කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු හෝ රු. 498,960/- ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍යආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු ලවා සහතික කරනු ලැබ තිබිය යුතුය.

(vi) මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් යොමු කළ හැකි අවසාන දිනය - **2024.12.08**

(vii) අපගේ නිල වෙබ් අඩවියට පිවිස, මාර්ගගත ක්‍රමය මගින් **2024.12.08** දිනට ප්‍රථම අයදුම්පත් යොමු කිරීම සිදු කල යුතු අතර, නිවැරදිව සම්පූර්ණ කර බාගත කර ගන්නා ලද අයදුම්පත් අයදුම්කරුගේ අත්සන සහිතව හා අත්සන සහතික කර ගැනීමෙන් අනතුරුව **2024.12.15** වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

ලේකම්, (බඳවාගැනීම් අංශය)
බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නො 628, 10 වන මහල,
ජනජයසිටි ගොඩනැගිල්ල,
නාවල පාර, රාජගිරිය.

අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**අධ්‍යාපනවේදී උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2024**" ලෙස අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.

(viii) අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ නැති වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරුවන් විසින් විඳදරා ගත යුතුය. එමෙන්ම අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

7. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිඳු අයුරකින් සලකා බලනු නොලැබේ.

8. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ. එසේම මෙම බඳවා ගැනීම කල් දැමීම, අවලංගු කිරීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම/ නොගැනීම පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

9. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමට අදාළ ව ඒ බව සඳහන් කරමින් නිවේදනයක්, කැඳවීමේ ලිපිය හා සම්මුඛ පරීක්ෂණ කාල සටහන බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.wp.gov.lk වෙත පළ කරනු ඇත. ඒ බව නිල කෙටි පණිවිඩයක් මගින් ද ඔබ වෙත දැනුම් දෙනු ඇත.

10. ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයට අනුව සම්මුඛ පරීක්ෂණ කාලසටහනෙ හි ඔබගේ විස්තර ඇතුළත් වී නොමැති නම් ඒ බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් විමසිය හැකි ය. එහි දී ඔබ විසින් බාගත කර ගත් අයදුම්පතෙහි පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය .

11. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත පරිදි අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයන් සඳහා කැඳවනු ඇත. මේ සඳහා අයදුම් කරනු ලබන සියලුම අයදුම්කරුවන් සුදුසුකම් සම්පූර්ණ කර ඇතැයි උපකල්පනය කර සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වීමට අවස්ථාව දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වීමට අවස්ථාව ලබා දීම, සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවට පිළිගැනීමක් වශයෙන් නොසැලකිය යුතු ය. එසේ වුව ද අයදුම්කරු සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව අනාවරණය වන ඕනෑම අවස්ථාවක දී අපේක්ෂකත්වය අවලංගු කිරීමට හා පත්වීම ලබා දීම ප්‍රතික්ෂේප කිරීමේ බලය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

12. සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේ දී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ. එමෙන් ම සම්මුඛ පරීක්ෂණ දිනයට සියලු සහතික ඉදිරිපත් කළ යුතු වන අතර පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් බාරගනු නොලැබේ.

13. මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වේ.

14. පත්වීම් ලිපියේ සඳහන්ව ඇති පත්වීම් දින සිට දින 14ක් ඇතුලත වැඩ භාරගැනීම සිදු කළ යුතු අතර, එසේ නොවුනහොත් නැවත දැනුම් දීමකින් තොරව පත්වීම අවලංගු වේ.

තිලක් සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2024 නොවැම්බර් මස 22 වැනි දින.

**උපලේඛනය 01**

| *භාෂා මාධ්‍යය* | *කේත අංකය* |
|---|---|
| සිංහල මාධ්‍යය | 1 |
| දෙමළ මාධ්‍යය | 2 |
| ඉංග්‍රීසි මාධ්‍යය | 3 |

**උපලේඛනය 02**

| *අනු අංකය* | *විෂයය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|
| 01 | ප්‍රාථමික | අ.පො.ස. (උසස් පෙළ) මව් භාෂාව විෂයයක් ලෙස සමත් වී තිබීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ මව් භාෂාව ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 02 | ඉංග්‍රීසි | අදාළ විෂයය අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස /විෂයය ධාරාව ලෙස හදාරා තිබීම ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 03 | නැටුම් (දේශීය) | අදාළ විෂයය අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස /විෂයය ධාරාව ලෙස හදාරා තිබීම ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 04 | සංගීතය (පෙරදිග) | අදාළ විෂයය අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස /විෂයය ධාරාව ලෙස හදාරා තිබීම ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 05 | විද්‍යාව | අදාළ විෂයය අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස /විෂයය ධාරාව ලෙස හදාරා තිබීම ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 06 | ගණිතය | අදාළ විෂයය අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස /විෂයය ධාරාව ලෙස හදාරා තිබීම ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 07 | සිංහල | අදාළ විෂයය අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස /විෂයය ධාරාව ලෙස හදාරා තිබීම ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 08 | දෙමළ | අදාළ විෂයය අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස /විෂයය ධාරාව ලෙස හදාරා තිබීම ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 09 | ඉතිහාසය | අදාළ විෂයය අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස /විෂයය ධාරාව ලෙස හදාරා තිබීම ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 10 | බුද්ධ ධර්මය | අ.පො.ස. (උසස් පෙළ) බුද්ධ ධර්මය හෝ බෞද්ධ ශිෂ්ටාචාරය විෂයයන් හදාරා තිබීම හා ඉන් සමත් වී තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |

| අනු අංකය | විෂයය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|
| 11 | හින්දු | අ.පො.ස. (උසස් පෙළ) හින්දු විෂයය හෝ හින්දු ශිෂ්ටාචාරය හදාරා තිබීම හා ඉන් සමත් වී තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 12 | ඉස්ලාම් | අ.පො.ස. (උසස් පෙළ) ඉස්ලාම් විෂයය හෝ ඉස්ලාම් ශිෂ්ටාචාරය හදාරා තිබීම හා ඉන් සමත් වී තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 13 | රෝමානු කතෝලික | අදාළ විෂයය අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස /විෂයය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 14 | ක්‍රිස්තියානි | අදාළ විෂයය අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස /විෂයය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 15 | භූගෝල විද්‍යාව | අදාළ විෂයය අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස /විෂයය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 16 | පුරවැසි අධ්‍යයනය | අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස දේශපාලන විද්‍යාව විෂයය හදාරා තිබීම හා ඉන් සමත් වී තිබීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 17 | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | අදාළ විෂයය අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස /විෂයය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 18 | ව්‍යවසායකත්ව අධ්‍යයනය | අ.පො.ස. (උසස් පෙළ) වානිජ විෂයය ධාරාව හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 19 | හින්දි | අදාළ විෂයය අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස /විෂයය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 20 | අරාබි | අදාළ විෂයය අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස /විෂයය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 21 | චීන | අදාළ විෂයය අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස /විෂයය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |

| අනු අංකය | විෂයය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|
| 22 | ජර්මන් | අදාළ විෂයය අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස /විෂයය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 23 | ජපන් | අදාළ විෂයය අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස /විෂයය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 24 | ප්‍රංශ | අදාළ විෂයය අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස /විෂයය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 25 | කොරියන් | අදාළ විෂයය අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස /විෂයය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 26 | දෙවන භාෂාව (සිංහල) | අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සඳහා දෙවන භාෂාව (සිංහල) විෂයයට A සාමාර්ථයක් ලබා තිබීම සමග අ.පො.ස. (උසස් පෙළ) ඕනෑම විෂයය ධාරාවකින් සමත් වී තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 27 | දෙවන භාෂාව (දෙමළ) | අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සඳහා දෙවන භාෂාව (දෙමළ) විෂයයට A සාමාර්ථයක් ලබා තිබීම සමග අ.පො.ස. (උසස් පෙළ) ඕනෑම විෂයය ධාරාවකින් සමත් වී තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 28 | සංගීතය (අපරදිග) | අදාළ විෂයය අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස /විෂයය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 29 | සංගීතය (කර්ණාටක) | අදාළ විෂයය අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස /විෂයය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 30 | චිත්‍ර | අදාළ විෂයය අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස /විෂයය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 31 | නැටුම් (භාරතීය) | අදාළ විෂයය අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස /විෂයය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 32 | නාට්‍ය හා රංග කලාව | අදාළ විෂයය අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස /විෂයය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |

| *අනු අංකය* | *විෂයය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|
| 33 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | අදාළ විෂයය අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස /විෂයය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 34 | කෘෂි හා ආහාර තාක්ෂණය | අ.පො.ස. . (උසස් පෙළ) ජීව විද්‍යා විෂයය ධාරාව හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයය ධාරාව කෘෂි විද්‍යාව විෂයයක් ලෙස ඇතුළත්ව හදාරා ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 35 | ශිල්ප කලා | අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සඳහා ශිල්ප කලා විෂයයට A සාමාර්ථයක් ලබා තිබීම සමග අ.පො.ස. (උසස් පෙළ) ඕනෑම විෂයය ධාරාවකින් සමත් වී තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය සම්පූර්ණ කර තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 36 | ගෘහ ආර්ථික විද්‍යාව | අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සඳහා ගෘහ ආර්ථික විද්‍යාව විෂයයයට A සාමාර්ථයක් ලබා තිබීම සමග අ.පො.ස. (උසස් පෙළ) ඕනෑම විෂයය ධාරාවකින් සමත් වී තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය සම්පූර්ණ කර තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 37 | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යයනය | අ.පො.ස. (සා.පෙළ) සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය විෂයයට A සාමාර්ථයක් ලබා තිබීම සමග, අ.පො.ස. (උසස් පෙළ) ඕනෑම විෂයය ධාරාවකින් සමත් වී තිබීම හා ක්‍රීඩා ජයග්‍රහණ අවම වශයෙන් දිස්ත්‍රික් හෝ පළාත් මට්ටම ලබා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය සම්පූර්ණ කර තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 38 | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | අදාළ විෂයය අ.පො.ස. (උසස් පෙළ) විෂයයක් ලෙස /විෂයය ධාරාව ලෙස හදාරා තිබීම හා ඉන් සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස අදාළ විෂයය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 39 | විශේෂ අධ්‍යාපනය | අ.පො.ස. . (උසස් පෙළ) ඕනෑම විෂයය ධාරාවකින් සමත් වී තිබීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ විශේෂ අධ්‍යාපනය විෂයයක් ලෙස හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයට අදාළ ගුරු පුහුණුව ලබා තිබීම. |
| 40 | උපදේශනය | අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයයක් වශයෙන් උපදේශනය / මනෝ විද්‍යාව හදාරා තිබීම හෝ උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සම්පූර්ණ කර තිබීම. |
| 41 | පුස්තකාල ගුරු | අ.පො.ස. (උසස් පෙළ) මව් භාෂාව විෂයයක් ලෙස සමත් වී තිබීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ මව් භාෂාව ප්‍රධාන විෂයය හෝ අනු විෂයයක් ලෙස හදාරා තිබීම. |

11-296

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

මගේ අංකය - WPC/PSC/EXM/02

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරීන් (II ශ්‍රේණිය) සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ ප්‍රතිඵල - 2023

**විභාග ප්‍රතිඵල**

විභාගය පැවැත් වූ දිනය - **2024.07.13**

එක් එක් විෂයය සඳහා අවම වශයෙන් 40%ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත් අයදුම්කරුවන් විභාගය සමත් ලෙස සලකනු ලැබේ. එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා නොපැමිණි අයදුම්කරුවන් (AB) සංකේතයෙන් දක්වා ඇත. එක් එක් විෂයය සඳහා අයදුම්කර නොමැති අයදුම්කරුවන් (----) සංකේතයෙන් දක්වා ඇත.

| අනු. අංකය | විභාග අංකය | මුලකුරු සමග නම | ජා. හැ. අ. | මාධ්‍යය | ආයතන සංග්‍රහය හා බ. ප. කාර්ය පටිපාටික රීති | මුදල් රෙගුලාසි සහ රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය |
|---|---|---|---|---|---|---|
| 1 | E2401125 | පී. කේ. සී. එන්. දිල්රුක්ෂි | 828531247V | සිංහල | 46 | 69 |
| 2 | E2401126 | ආර්. එම්. එන්. එච්. මැණිකේ | 866441707V | සිංහල | 34 | 22 |
| 3 | E2401127 | ආර්. එම්. එන්. ඩී. රත්නායක | 866323232V | සිංහල | AB | AB |
| 4 | E2401128 | ආර්. පී. එච්. ඉරෝෂිනී | 865530790V | සිංහල | AB | AB |
| 5 | E2401129 | එම්. බී. කේ. ජී. කේ. මණ්ඩාවල | 816821223V | සිංහල | AB | AB |
| 6 | E2401130 | ඊ. කේ. එන්. දිල්රුක්ෂි | 795970703V | සිංහල | 58 | 68 |
| 7 | E2401131 | එච්. අයි. ජී. ඩී. දේශානි | 198272300855 | සිංහල | 49 | 54 |
| 8 | E2401132 | එච්. ඩී. එල්. කේ. ජයවර්ධන | 806055069V | සිංහල | ---- | AB |
| 9 | E2401133 | එච්. ඩී. සී. සී. හෙයියන්තුඩුව | 198569200402 | සිංහල | 53 | 61 |
| 10 | E2401134 | එන්. එච්. ඒ. ඩී. නවරත්න | 197454903270 | සිංහල | ---- | AB |
| 11 | E2401135 | එම්. එන්. සී. විතානගේ | 817962351V | සිංහල | 64 | 64 |
| 12 | E2401136 | එම්. එස්. සුරංගි | 855681757V | සිංහල | 51 | 52 |
| 13 | E2401137 | එම්. ඒ. එස්. එස්. මල්ලවආරච්චි | 875590553V | සිංහල | 48 | 49 |
| 14 | E2401138 | එස්. අයි. දූෂාන්ත | 198211404248 | සිංහල | AB | AB |
| 15 | E2401139 | එස්. එස්. සී. වීරසිංහ | 837753775V | සිංහල | AB | AB |
| 16 | E2401140 | එස්. ජී. කොඩිතුවක්කු | 833463578V | සිංහල | 55 | 69 |
| 17 | E2401141 | ඒ. එන්. රත්නායක | 197761200618 | සිංහල | 50 | 67 |

| අනු. අංකය | විභාග අංකය | මුලකුරු සමග නම | ජා. හැ. අ. | මාධ්‍යය | ආයතන සංග්‍රහය හා බ. ප. කාර්ය පටිපාටික රීති | මුදල් රෙගුලාසි සහ රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය |
|---|---|---|---|---|---|---|
| 18 | E2401142 | ඒ. එම්. අයි. යූ. අතුකෝරාල | 856703819V | සිංහල | AB | AB |
| 19 | E2401143 | ඒ. ඩී. එස්. ඩී. රණසිංහ | 796174323V | සිංහල | 36 | 40 |
| 20 | E2401144 | කේ. ආර්. කේ. ගොඩිගමුව | 198165602317 | සිංහල | 45 | 16 |
| 21 | E2401145 | කේ. එල්. එස්. ද සිල්වා | 866210748V | සිංහල | 52 | 50 |
| 22 | E2401146 | කේ. ඒ. ඊ. එච්. ප්‍රියංගිකා | 857193520V | සිංහල | 63 | 68 |
| 23 | E2401147 | කේ. ඩබ්. ඒ.  නිමාලි | 198568801644 | සිංහල | 62 | 52 |
| 24 | E2401148 | කේ. ඩී. එම්. ගයන්ති | 848501263V | සිංහල | 51 | 42 |
| 25 | E2401149 | ජී. ආර්. එස්. එන්. එම්. කුමාරි | 875042335V | සිංහල | AB | AB |
| 26 | E2401150 | ජී. ඩී. එන්. එම්. ගමගේ | 867423613V | සිංහල | AB | AB |
| 27 | E2401151 | ජේ. එම්. එන්. මධුවන්ති | 198566600095 | සිංහල | 48 | 47 |
| 28 | E2401152 | ජේ. එල්. සී. පුෂ්පිකා | 868062312V | සිංහල | 79 | 45 |
| 29 | E2401153 | ජේ. ඒ. එම්. එස්. වීරසිංහ | 848572004V | සිංහල | AB | AB |
| 30 | E2401154 | ජේ. පී. සී. එස්. ගුණවර්ධන | 197824600765 | සිංහල | 42 | 51 |
| 31 | E2401155 | ටී. එස්. අයි. ප්‍රනාන්දු | 867271767V | සිංහල | 54 | 44 |
| 32 | E2401156 | ටී. ජී. එස්. මුණසිංහ | 197851100951 | සිංහල | 47 | ---- |
| 33 | E2401157 | එච්. පී. එන්. කේ. මංගලිකා | 798482815V | සිංහල | AB | AB |
| 34 | E2401158 | ඩබ්. ආර්. එම්. එන්. අයි. ගුණතිලක | 776523003V | සිංහල | 47 | 61 |
| 35 | E2401159 | ඩී. එල්. එම්. ඩී. මධුරංගනී | 875370588V | සිංහල | AB | AB |
| 36 | E2401160 | ඩී. එල්. එස්. නයෝමි | 876150506V | සිංහල | 67 | 70 |
| 37 | E2401161 | පී. ඩී. එම්. එච්. දිසානායක | 198369100990 | සිංහල | 50 | 46 |
| 38 | E2401162 | බී. ඒ. පී. තිසේරා | 825590030V | සිංහල | 40 | 57 |
| 39 | E2401163 | බී. පී. ආර්. ද සිල්වා | 778380285V | සිංහල | ---- | 54 |
| 40 | E2401164 | එම්. පී. ඩී. එස්. ධර්මප්‍රිය | 827675210V | සිංහල | 43 | 69 |

තිලක් සෙනරත්,
ලේකම්,
බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

අංක 628, ජන ජය සිටි ගොඩනැගිල්ල,
නාවල පාර, රාජගිරිය.

11-236

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.